# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1994/26 - 2016 නොවැම්බර් මස 21 වැනි සඳුදා - 2016.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2016 ඔක්තෝබර් මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය (අංක 4) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි III වැනි තීරුවෙහි ''ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය පනත (1990 අංක 18)'' යන්නට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් :-

''ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත (2006 අංක 30)''

12 - 247


1A - G 24604 — 17 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*